# ඡායා රූ පිළිසඳර

2007 සැප්තැම්බර්/ඔක්තෝම්බර්

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**




## ඩින්ටන් ජයසූරිය ගුරු උපහාර...

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ නිර්මාතෘ දිවංගත විල්සන් හෑගොඩ ශූරීන් සමග එක්ව වත්මන් ප්‍රගමනය කරා සංගමය මෙහෙයවූ ඩින්ටන් ද එස්. ජයසූරිය මැතිතුමා, එදා මෙදා තුර එතුමා ඉටුකල එම මෙහෙවර වෙනුවෙන් අතීත වර්තමාන සියලු සංගමිකයන්ගෙන් පිදුම් ලබයි.**




## සංවත්සර මහා සභා රැස්වීම


ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 54වන මහා සභා රැස්වීම ජූනි මස 24වන දා කොළඹ මහවැලි කේන්ද්‍රයේ දී පැවැත්විණි. ඒ අවස්ථාවේ දී පත්කර ගන්නා ලද නව නිලධාරි මණ්ඩලය මෙසේයි.

සභාපති/ අධ්‍යක්‍ෂ - ආචාර්ය උදිත ගුණසේකර (BSc, MPhil, PhD, AFIAP, Hon FNPAS)
විධායක අධ්‍යක්‍ෂ - එන්. ආර්. අභයසිංහ (Hon FNPAS)
මුදල් අධ්‍යක්‍ෂ - කීර්ති නිශ්ශංක (Hon FNPAS)
අධ්‍යාපන අධ්‍යක්‍ෂ - ශාන්ති ලාල් ප්‍රනාන්දු (BSc(sp), MSc,PCGE, MBCS)
ලේඛකාධිකාරි/අධ්‍යක්‍ෂ - සේනාරත්න බණ්ඩාර (Hon FNPAS)
ප්‍රදර්ශන අධ්‍යක්‍ෂ - සුනිල් වික්‍රම
ප්‍රකාශන අධ්‍යක්‍ෂ - ශාන්ත ගුණරත්න (ANPAS)
සමාජසේවා අධ්‍යක්‍ෂ - සුනිල් ලියනගේ (Hon FNPAS)
සංවර්ධන සහ ප්‍රවර්ධන අධ්‍යක්‍ෂ - පියසෝම කෝරලේ විදාන

විශාල සාමාජික සාමාජිකාවන් පිරිසක් සහභාගි වූ මේ අවස්ථාවේ දී සංගමයේ ඉදිරි කටයුතු පිළිබඳ යෝජනා රැසක් සභා සම්මත කර ගන්නා ලදී.

## ප්‍රියන්ත අබේසුන්දරගේ රේඛා චිත්‍ර ප්‍රදර්ශනය

# "ස්වභාවී"



ලංකා කැමරා සඟරාවේ හිටපු ප්‍රකාශන අධ්‍යක්ෂවරයකු වන ප්‍රියන්ත අබේසුන්දර ගේ රේඛා චිත්‍ර ප්‍රදර්ශනය පසුගිය අගොස්තු මස 3 සිට 6 දක්වා ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ දී පැවැත්විණි.

රේඛා චිත්‍ර 30ක් පමණ ඇතුලත් වූ මෙහි දී නිරූපනය වූයේ මීට වසර පනහකට එපිට වූ ගැමි පරිසරය හා සිරිත් විරිත් ය. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍යකලා පීඨයේ සහකාර කථිකාචාර්යවරයකු වන ඒ මහතා දක්ෂ ඡායාරූප ශිල්පියකු ද වේ.

---

## ස්වභාව සෞන්දර්ය හා වනජීවි ඡායාරූප ප්‍රදර්ශනය

සංගමයේ ඡායාරූප පාඨමාලාව හදාරන සිසුන් සඳහා 2006 හා 2007 වසර තුළ ක්‍රියාත්මක කල ස්වභාව සෞන්දර්ය හා වනජීවි ඡායාරූපකරණ ව්‍යාපෘතියේ අවසාන ඵලය ඡායාරූප ප්‍රදර්ශනයක් ලෙස ඉදිරිපත් කිරීමට සැරසේ. මෙම ව්‍යාපෘතිය සංගමයේ අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යාපන කමිටුව විසින් දියත් කරන ලද්දකි. මෙම ප්‍රදර්ශනය 2007 සැප්තැම්බර් මස 8, 9, 10, 11 දිනයන්හි, කොළඹ ජාතික කලා භවනේ දී පැවැත්වේ.

මෙ ව්‍යාපෘතියට අදාල ප්‍රථම චාරිකාව හා වැඩමුළුව හෝටන් තැන්නේ කඳවුරු බිම් ආශ්‍රිතව 2006 නොවැම්බර් මස 10,11 හා 12 යන දිනවල පැවැත්වුණු අතර දෙවන චාරිකාව හා වැඩමුළුව 2007 මාර්තු මස 9, 10, 11 දිනවල යාල වනෝද්‍යානය තුළ පවත්වන ලදී. මෙම චාරිකා දෙක සඳහා සංගමයේ සාමාජිකයින් විශාල පිරිසක් සහභාගි වූ අතර මෙහි සම්පත් දායකයින් ලෙස සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් කිහිප පොළක් මෙන්ම ආරාධිත ප්‍රවීණ ඡායාරූප ශිල්පීන් කිහිප දෙනෙකුද ක්‍රියා කළහ. මෙයට සමගාමීව සංගමයේ හිටපු විධායක අධ්‍යක්ෂ ඩින්ටන් එස්. ජයසූරිය මහතා හට උපහාර පිදීමේ උළෙලක් ද පැවැත්වේ.

මෙම ව්‍යාපෘතිය හා ප්‍රදර්ශනය සඳහා ප්‍රධාන අනුග්‍රහය දක්වන ලද්දේ ෆූජි ෆිල්ම් ගෙන්වා බෙදාහරින හේලීස් ආයතනය වන අතර ප්‍රදර්ශනයේ සම අනුග්‍රාහකයින් ලෙස ඡායාරූප ක්ෂේත්‍රයේ තවත් ආයතන කීපයක් කටයුතු කරයි.

## ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවන් සඳහා මාසිකව පැවැත්වෙන වැඩමුළු හා සම්මන්ත්‍රණ

සැම මසක ම පන්ති පැවැත්වෙන පළමු ඉරිදා දිනවල සංගමයේ ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කළ සාමාජිකයින් සඳහා විශේෂිත වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීමට කටයුතු යොදා ඇත. මේ යටතේ පැවැත්වුණු පළමු වැඩමුළුව ජූනි මස 3වන දින ඇක්මි ආයතනයේ අධිපති රංජන් ද සිල්වා මහතා විසින් එම ආයතනයේ දී පවත්වන ලදී. මෙදින ඩිජිටල් ඡායාරූප කරණය පිළිබඳ මූලික හැඳින්වීමක් හා උපකරණ හඳුන්වාදීමක් සිදුකරන ලදී. මෙහි දෙවන සම්මන්ත්‍රණය ජූලි මස 8 දින ''කලාත්මක ඡායාරූපකරණය'' යන මැයෙන් ප්‍රවීණ දේශක සහ ජාත්‍යන්තර සම්මානලාභී ඡායාරූප ශිල්පී හෙන්රි රාජකරුණා මහතා විසින් මහාබෝධි විද්‍යාලයේ දී පවත්වන ලදී. මේ යටතේ පැවැත්වෙන තුන්වන වැඩුමුළුව හා සම්මන්ත්‍රණය ප්‍රවීණ ඡායාරූප ශිල්පි පණ්ඩුක සිල්වා මහතා විසින් 2007 අගෝස්තු මස 5වන දින පවත්වන ලදී.

මෙම සම්මන්ත්‍රණ මාලාවේ ඉදිරි කාල සටහන පහත පරිදි වේ. 2007 සැප්තැම්බර් 09, ඔක්තෝම්බර් 07 සහ නොවැම්බර් 04 ඉරිදා දිනවල විවිධ මාතෘකා ඔස්සේ වැඩමුළු හෝ සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලැබේ. මෙම ඉදිරි වැඩසටහන් සඳහා සහභාගිවීමට කැමති අය සහ වැඩි විස්තර ලබාගැනීම සඳහා 0712 791026 අංකයෙන් නාරද අමරතුංග මහතා අමතන්න.

---

## සංගමයේ ශෝකය

සාමාජික අංක : 2819 දරණ ආර්. එස්. අලගල්ල මහතාගේ පියාණන් වන විශ්‍රාමලත් විදුහල්පති, සාමවිනිසුරු එච්. පී. සේනාරත්න මහතා 2007 මැයි මස 07 වන දින අභාවප්‍රාප්ත විය. එතුමාගේ අභාවය පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පිරිනමමු.

සංගමයේ ප්‍රකාශන අධ්‍යක්ෂ ශාන්ත ගුණරත්න (එල්. එම්. 113) මහතාගේ මැණියන් 2007 ජූනි 15වන දින අභාවප්‍රාප්ත වූවා ය. ශාන්ත ගුණරත්න මහතා ඇතුළු පවුලේ සැම වෙත සංගමයේ ශෝකය මෙසේ පල කර සිටිමු.

සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වූ සුදත් පෙරේරා මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඔහුගේ අභාවය පිළිබඳව ශෝකය මෙයින් පිරිනමමු.

මෙයට අමතරව සංගමයේ සාමාජිකයන් වන ඒ. එච්. ජී. ආර්. ප්‍රනාන්දු මහතාගේ මාමන්ඩිය සහ කුමාර දහනායක මහතාගේ පියණන් ද මෑතක දී අභාවප්‍රාප්ත වූ අතර එම දෙපළ ඇතුළු පවුලේ සාමාජිකයන් වෙත අප සංගමයේ ශෝකය මෙයින් පළකර සිටිමු.

සංගමයේ සාමාජිකා ලලනි වක්කුඹුර මෙනවියගේ දයාබර නැගණිය ඉන්ද්‍රාණි වක්කුඹුර මෙනවිය පසුගිය අගෝස්තු 18වන දින අභාවප්‍රාප්ත වූවා ය. ඒ පිළිබඳ සංගමයේ සාතිශය සංවේගය මෙසේ පලකර සිටිමු.

///////////////////////////////////////////////////////////////////////

# අධ්‍යක්ෂවරුන් යටතේ ඇති අනුකමිටු

සංගමයේ එක් එක් අධ්‍යක්ෂවරුන් යටතේ පහත සඳහන් අනු කමිටු පත්කර ඇත.

**මුදල් අධ්‍යක්ෂ අනු කමිටුව**

අමරා වීරසේකර මහත්මිය, තිනේෂා අරුණශාන්ති එදිරිසිංහ මෙනවිය

**අධ්‍යපන අනු කමිටුව**

පළමු වසර පංතිභාර උපදේශක - ශාන්ත ගුණරත්න මහතා
දෙවන වසර පංතිභාර උපදේශක - ටී. එස්. ටී. සිල්වා මහතා
ඩිප්ලෝමා වසර පංතිභාර උපදේශක - මහේෂ් ප්‍රසන්න මහතා
වෘත්තිය කණ්ඩායම භාර උපදේශක - නාරද අමරතුංග මහතා

මාසික තරග සංවිධානය - අශෝක පේමසිරි මහතා
තිනේෂා අරුණශාන්ති මෙනෙවිය

වෘත්තිය කණ්ඩායම සම්බන්ධීකරණය
- සම්පත් පීරිස් මහතා
අර්ජුන පත්මපෙරුම මහතා
ජූඩ් සී. සිල්වා මහතා

ප්‍රායෝගික වැඩමුළු සහ
අධ්‍යාපන චාරිකා සංවිධානය- චන්ද්‍රසේන පෙරේරා මහතා

ජාත්‍යන්තර ඡායාරූප තරග හා
ප්‍රදර්ශන සම්බන්ධීකරණය - ප්‍රියන්ත අමරසිංහ මහතා
සමන්ත සේනක බණ්ඩාර මහතා

**ප්‍රකාශන අධ්‍යක්ෂ යටතේ පවතින අනුකමිටු**

**1. ලංකා කැමරා අනු කමිටුව**

නාරද අමරතුංග මහතා, උදේනි අල්විස් මහතා, සම්පත් පීරිස් මහතා, රවීන්ද්‍ර පුෂ්පකුමාර මහතා, අතුල රණරාජ මහතා, සංජය ජයවර්ධන මහතා

**2. පිළිසඳර අනු කමිටුව**

විරාජ් ලියනආරච්චි මහතා, එස්. එම්. කඳනආරච්චි මහතා, ප්‍රභාත් චමින්ද මහතා, ඒ. එච්. මෙත්තානන්ද මහතා, ටී. ඒ. යූ. සිරිවිමල මහතා, ලලනි වක්කුඹුර මෙනෙවිය, චානක ප්‍රියදර්ශන මහතා, බුද්ධිකා ගමගේ මහත්මිය, සුනන්ද කෝදාගොඩ මහතා, එස්. ඩී. පියදාස මහතා, එස්. රාමදාස් මහතා, ඩී. නුවන් ගල්පාය මහතා

**සමාජසේවා හා සුබසාධන අනු කමිටුව**

එල්. බී. එස්. එස්. බාලසූරිය මහතා, ශ්‍යාමලි කරුණාපාල මහත්මිය, අශෝක ප්‍රේමසිරි මහතා, තිනේශා එදිරිසිංහ මෙනවිය, නෙරංජන් වික්‍රමආරච්චි මහතා, ඉන්දික හෙට්ටිආරච්චි මහතා, ඉන්දික ප්‍රභාත් දසනායක මහතා, බුද්ධික වික්‍රමසිංහ මහතා, දේවිකා තුෂාන්ති ගුණතිලක මෙනෙවිය, නිශාදි ගුණවර්ධන මෙනෙවිය, එච්. ඩී, කේ. ශිරෝමි පීරිස් මෙනෙවිය, රංජනී අරංදර මහත්මිය, ප්‍රදීප් වෙදමෙස්ත්‍රිගේ මහතා

## ලිපිනය වෙනස්වීම්

සංගමයට ලබා දී ඇති ඔබගේ ලිපිනය වෙනස් වුවහොත් ඔබගේ සාමාජික අංකය හා නව ලිපිනය විධායක අධ්‍යක්ෂ වෙත දන්වා එවන්න. සංගමයෙන් යවනු ලබන සමහර ලිපි ''හැරගොස් ඇත.'', ''ලිපිනයේ මේ නමින් අයකු නොමැත'' යනාදී සටහන් යොදා සමහර ලිපි ආපසු අප වෙත ලැබේ. ඔවුන්ගේ ලිපිනයන් සාමාජික ලේඛනයෙන් ඉවත් කිරීමට සිදුවේ.

## සාමාජික මුදල් ගෙවීම

2004 වසරට පෙර වසරවල් සඳහා සාමාජික මුදල් ගෙවා නොමැති අයගේ නම් සාමාජික ලේඛණයෙන් නැවත දැනුම් දීමකින් තොරව ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. නැවත සාමාජිකත්වය අවශ්‍ය වුවහොත් නව සාමාජික අංකයක් යටතේ එය ලබා ගත හැකි වේ.

සාමාජික මුදල්-මුදල් අධ්‍යක්ෂ නමට ලියන ලද රේඛණය කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුව බම්බලපිටිය ශාඛාවේ ජංගම ගිණුම් අංක 717752 ට ගෙවන ලද මුදල් පැවරුම් පත්‍රයක් මගින්ද ගෙවිය හැකිය. එහි මුල් පිටපත තම සාමාජික අංකය හා නමද ලියා මුදල් අධ්‍යක්ෂ වෙතට එවන්න. කිසිම හේතුවක් නිසාවත් මුදල් ඇනවුම් භාර නොගන්නා බවද දන්වා සිටිමු.

## පිළිසඳරට වෙහෙස මහන්සිය

- එන්. ආර්. අබේසිංහ මහතා
- සුනිල් ලියනගේ මහතා
- ශාන්ත ගුණරත්න මහතා ඇතුළු ප්‍රකාශන අනුකමිටුව

## තිමති වීරරත්නගේ
## Eye of 70

සංගමයේ යාවජීව සාමාජික, ප්‍රවීන ඡායාරූප ශිල්පී තිමති වීරරත්න මහතා ඉදිරිපත් කල හතරවන ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය අගෝස්තු 25, 26, 27 යන දිනයන්හිදී බණ්ඩාරනායක සම්මන්ත්‍රන ශාලාවේ ඇති සිනමා ශාලාවේ දී පවත්වන ලදී.

ඒ මහතා විසින් වයස අවුරුදු 65 සිට 70 දක්වා කාලය තුල ගන්නා ලද ඡායාරූප 100ක් පමණ මේ සඳහා ඇතුලත් කර තිබූ අතර මේ වසරේ දී ඒ මහතාට වසර 70ක් ද සපිරේ. එලෙසින් ම තමාගේ ඡායාරූප දිවියට වසර 50ද පිරේ. සංස්කෘතික අමාත්‍ය ලක්ෂමන් යාපා අබේවර්ධන මැතිතුමා විසින් විවෘත කරන ලද මෙම ප්‍රදර්ශනය සඳහා අනුග්‍රහය දක්වන ලද්දේ ෆුජි සේයා පට ගෙන්වා බෙදාහරින හේලීස් කන්සියුමර් ප්‍රඩක්ට්ස් ආයතනය සහ ෆොටෝ ටෙක්නිකා ආයතනයයි.





# ජාත්‍යන්තර සාමාජික ජයග්‍රහණ

Patronage No. 2005/122

**FIAP ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ අනුමැතිය යටතේ පවත්වන ලද ඡායාරූප තරග හා ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයින්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2006 වසර තුළ සහ 2007 ජූලි මස දක්වා ප්‍රදර්ශන 13ක් වෙත ඡායාරූප ඉදිරිපත් කරන ලද බව සතුටින් දන්වමු. මෙම ප්‍රදර්ශනවල දී සාමාජිකයින්ගේ කෘති සඳහා ලැබුණු ඇගයීම් පහත පරිදි වේ.**

| **ප්‍රදර්ශනයේ නම සහ රට** | **ඡායාරූප යැවු ශිල්පීන් ගණන** | **ප්‍රදර්ශනය වූ කෘති/ ලැබූ ඇගයීම්** | |
|---|---|---|---|
| *13th International Biennale of Photo and Colour Slides Competition 2006/73 - Hungary* | 20 | 1. සමන්ත සේනක බණ්ඩාර | - 02 |
| | | 2. ප්‍රියන්ත අමරසිංහ | - 01 |
| | | 3. බන්දු ගුණරත්න | - 01 |
| | | 4. චමින්ද ප්‍රියන්ජිත් උපසේන | - 01 |
| | | 5. චමින්ද ගෝමස් | - 01 |
| | | | 06 |
| *Doprava Transport 2006 XV Competition in International Art Photography 2006/026 Slovakia* | 06 | 1. සමන්ත සේනක බණ්ඩාර | - 02 |
| | | 2. චමින්ද ප්‍රියන්ජිත් උපසේන | - 02 |
| | | 3. ප්‍රියන්ත අමරසිංහ | - 01 |
| | | 4. බන්දු ගුණරත්න | - 01 |
| | | 5. සුනිල් වික්‍රම | - 01 |
| | | 6. ශාන්ත ගුණරත්න | - 01 |
| | | | 08 |
| *42nd Javense Salon of Photographic Art 2006 2006/093 Brasil* | 14 | 1. සුනිල් වික්‍රම | - 01 |
| | | 2. ප්‍රියන්ත අමරසිංහ | - 01 |
| | | 3. චන්ද්‍රසේන පෙරේරා | - 01 |
| | | 4. ශාන්ත ගුණරත්න | - 01 |
| | | 5. සුනන්ද කෝදාගොඩ | - 01 |
| | | | 05 |
| *31 Zadreb Salon International Exibition of Photography 2006/043 Croatie* | 06 | 1. බන්දු ගුණරත්න | - 02 |
| | | 2. සමන්ත සේනක බණ්ඩාර | - 01 |
| | | 3. චමින්ද ප්‍රියන්ජිත් උපසේන | - 01 |
| | | | 04 |
| *Forty Nine Dum Dum Salon - 2006 2006/080 India* | 15 | බන්දු ගුණරත්න මහතාගේ එක් නිර්මාණයක් පමණක් ප්‍රදර්ශනයට තෝරා ගැණින. | |
| *50 Si Maitland International Salon of Photography 2007/003 Australia* | 07 | 1. බන්දු ගුණරත්න | - 02 |
| | | 2. සුනිල් වික්‍රම | - 01 |
| | | | - 03 |
| | | මෙහිදී බන්දු ගුණරත්න මහතා විසින් කුසලතා සහතිකයක් දිනාගන්නා ලදී. | |
| *7Austrian Trierenberg Sper Circuit 2007/038-041 Austria* | 07 | 1. බන්දු ගුණරත්න | - 06 |
| | | 2. චන්ද්‍රසේන පෙරේරා | - 07 |
| | | 3. ප්‍රියන්ත අමරසිංහ | - 06 |
| | | 4. සමන්ත සේනක බණ්ඩාර | - 08 |
| | | 5. සුනිල් වික්‍රම | - 05 |
| | | 6. උදේනි අල්විස් | - 06 |
| | | 7. සුනන්ද කෝදාගොඩ | - 03 |
| | | | 41 |
| | | මෙහිදී බන්දු ගුණරත්න මහතා විසින් *FIAP* ලෝකඩ පදක්කමක් දිනාගන්නා ලදී. | |

*සටහන - සමන්ත සේනක බණ්ඩාර*

# ඩින්ටන් ජයසූරිය ගුරු උපහාර......

1 පිටුවෙන්....

**ආරම්භක යුගයේ සංගමයේ ලිපි තැපැල් කිරීමට, එවකට ටොරිංටන් චතුරස්‍ර තැපැල් ස්ථානයේ සේවය කල ජයසූරිය මහතා වෙත පැමිණි හැගොඩ ශූරින්ට එම කටයුතු සඳහා උදව් කල අතර ඉන් අනතුරුව හැගොඩ ශූරින්ගේ සෙවනැල්ල සේ හිඳිමින් සංගමයේ ගරු විධායක අධ්‍යක්ෂ තනතුර දක්වා දිගු ගමනක යෙදින.**

ඉතාමත් දැඩි ලෙස නීති ගරුකව සිය කටයුතු කල බව එතුමා ඇසුරු කල හා තතු දන්නා සැම පිළිගන්නා කරුණකි. එසේ ම සංගමිකයන් හා පන්ති සාමාජිකයන් ගේ හික්මීම හා විනය ඉතා ඉහලින් අපේක්ෂා කල ජයසූරිය මැතිතුමා, ඒ පිළිබඳ නිරන්තර විමසිල්ලෙන් පසුවිය. සංගමයේ සංවත්සර සභා රැස්වීම්වල දී මෙන් ම අනෙකුත් ඕනෑ ම අවස්ථාවක දී කුමන තරාතිරමක අයකුට වුව ද, තම අදහස් ඍජුව පලකල ඒ මහතා, සැමවිට ම නිවැරදි තීරණ ගත්තා පමණක් නොව සිය ස්ථාවරය ද වෙනස් කලේ නැත.

මාතර වැනි ඈත ප්‍රදේශයක ජීවත් වූ එතුමා සිය දරු පවුලට වඩා සංගමයට ආදරය කලේ ය. පුරා වසර ගණනාවක් විධායක අධ්‍යක්ෂ තනතුර හෙබවූ ජයසූරිය මහතා වෙත සංගමයේ ගරු සහාගී සම්මානය වන Hon.F.N.P.A.S පිරිනමා ඇත. දැනට එතුමා සංගමයේ කටයුතුවලින් මඳකට ඈත්ව සිටියත් සංගමයේ සහ සංගමිකයන්ගේ ආරාධනා ලබන ඕනෑ ම උත්සව හා විශේෂ අවස්ථාවන් සඳහා නොපිරිහෙලා සහභාගි වීම එතුමා තුළ දක්නට ලැබෙන සුවිශේෂි ලක්ෂණයකි.

තවමත් සංගමය තුළ ජීවත් වන, එය සිය ආත්මය කොටගත් මෙවන් උදාර මිනිසෙකු හට උපහාර පිදීමට අත්වැල් බැඳගැනීම අගය කළ යුතු ය. ඩින්ටන් ද එස්. ජයසූරිය මැතිතුමාට නිරෝගී සුවය හා දීර්ඝායුෂ පතමි.

**සුනිල් ලියනගේ**

*අධ්‍යක්ෂ - සමාජ සේවා හා සුභසාධන*

---

## සංගමයේ ඇසුරු (Associate) හා සභාගී (Fellow) සම්මාන

ඉහත සම්මාන සඳහා සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ඔබගේ ජීව දත්ත සහිත අයදුම් පත්‍රයක් සකස්කර, සංගමයට, ඡායාරූප ක්ෂේත්‍රයට කර ඇති සේවාවන් හා ජයග්‍රහණ සනාථ කිරීමේ සාධක හා සහතිකවල ඡායා පිටපත් ඇමිණූ සවිස්තරාත්මක ලිපි ගොනුවක් සකස් කර 2007 ඔක්තෝම්බර් මස 30 දිනට පෙර විධායක අධ්‍යක්ෂ වෙත යොමු කරන්න.

### සුදුසුකම්

**1. ඇසුරු සාමාජිකත්වය (Associate)**

(අ) අයදුම්කරු සංගමයේ සාමාජිකයෙකු විය යුතු අතර සංගමය මගින් පවත්වන ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වී වසරක් ගත වී තිබිය යුතු ය.

(ආ) සෙ.මී. 30x40 ප්‍රමාණයට වැඩි නොවන හා සෙ.මී. 20x25 ප්‍රමාණයට අඩු නොවන කළු/සුදු ඡායාරූප 10ක් ඉදිරිපත් කළ යුතු ය. මෙයට ආලේඛ්‍ය, භූමි දර්ශන හා මුද්‍රණ උපක්‍රම අඩංගුවිය යුතු ය. තමා විශේෂ නිපුණත්වයක් දක්වන අංශයක් ඇත්නම් එම අංශයේ පමණක් ඡායාරූප ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) සෙ.මී. 20x25 ප්‍රමාණයට අඩු නොවන වර්ණ ඡායාරූප 10ක් ඉදිරිපත් කිරීම

(ඈ) වර්ණ විනිවිදක ඉදිරිපත් කිරීම

(ඉ) ඉහත (ආ), (ඇ) හා (ඈ) දැක්වෙන නිර්මාණ ප්‍රදර්ශන මට්ටමේ ඇති බවට පරීක්ෂණ මණ්ඩලය සෑහිමකට පත්විය යුතු ය.

(ඊ) ඉහත (අ) සිට (ඈ) දක්වා සුදුසකම් නොමැති දේශීය හෝ විදේශීය ඡායාරූප ශිල්පීන් තමාගේ ඡායාරූප ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන 10ක ප්‍රදර්ශනය කර ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතු ය.

**2. සභාගී සාමාජිකත්වය (Fellow)**

(අ) ඡායාරූප 50කට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වූ ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම. මීට කළු සුදු ඡායාරූප 25ක් වත් තිබිය යුතු ය.

(ආ) ඡායාරූප ශිල්පයේ හෝ කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ මූලික කරුණුවලින් බැහැරව පර්යේෂණාත්මක මට්ටමේ ග්‍රන්ථයක් හෝ පරිවර්තන කෘතියක් ඉදිරිපත් කිරීම.

## අපට ලියන්න....

පිළිසඳරෙ හි පාඨකයන් වන ඔබ විසින් කරනු ලබන ඡායාරූප ශිල්පයට අදාළ කලා කටයුතු පිළිබඳ විස්තර අප වෙත එවන්න. අප ඒවා සුදුසු පරිදි පළ කරන්නෙමු. එසේත් නැතිනම් ඡායාරූප කලාව හා සම්බන්ධ ඔබ තුළ ඇති අදහස් ලියා එවන්න.

තව ද ඔබගේ නිර්මාණ පිළිසඳරේ පළ කිරීම සඳහා පහත ලිපිනයට ලැබෙන්නට සලස්වන්න. එසේ නැතහොත් පිළිසඳර අනුකම්ටුව වෙත බාර දෙන්න.

**ප්‍රකාශන අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය**
**තැ. පෙ. 452,**
**කොළඹ.**

# වීදුරු ඇස්



ඩී. එන්. අනෝජා පෙරේරා - පළමු වසර

**මා අද වැඩට ගියේ නැත. රැකියාව සඳහා පිටත්ව යන වේලාවට මම නිවසින් පිටත්වීමි. මා ගියේ රජයේ ආයතනයකට ලිපියක් ලබා ගැනීම සඳහාය. එහෙත් එය ඉෂ්ඨ කර ගැනීමට නොහැකි වූ මා විශ්‍රාම යන මාගේ මිතුරියකගේ සාදයකට සහභාගි වුනෙමි. සාදය අවසානයේ මිතුරියගෙන් සමුගත් මා හවස 4.00ට පමණ නිවසට පැමිණියෙමි. ගතේ විඩාබර ගතිය නිසා හාන්සි වූ මා රාත්‍රි 8.00ට පමණ නැගිට්ටෙමි. රාත්‍රී ආහාරයෙන් පසු මවත් සමග කුස්සියේ වැඩ නිම කර සාලයට පැමිණි මා පොතක් කියවීමට යැයි සිතා මේසය ලගට ගියමුත් විදුලි බුබුලේ ආලෝකයෙන් දිදුලන ඇසකින් මා දෙස බලා සිටින ඇය වෙත මගේ නෙත ගැටිණ.**

අගනා වෛවර්ණ විලාසිතාවන්ගෙන් හෙබි ඈ වර්ණවත් ය. විචිත්‍රවත් ය. මානව වර්ගයාගේ සිත් ඇද ගැනීමට සමත් වූ ඇය මහත් සේ ප්‍රසිද්ධ විය.

මේසය ලග වාඩි වී සිටි මට හැගුනේ ඇය මෙපමණ ලස්සන වීමට හේතුව කුමක් ද යන්නයි. මම ඈ දෙස බලා සිටියෙමි. ලස්සන වූ ඇසකින් ලෝකය දකීමට හැකිවීම කොතරම් අගනේ දැයි මට සිතේ. ඇයට මෙපමණ වූ සුන්දර ඇසක් බිහිවූයේ කෙසේ ද? මෙවැනි සුන්දර ඇසක් බිහිකළේ කවුරුන්ද? මම මගෙන් ම ප්‍රශ්ණ කලෙමි. නමුත් එයට පිළිතුරක් සොයා ගැනීමට නොහැකි විය. ඇය කවුරු විසින් මෙලොවට බිහි කලත් ඇයව බිහි කල අයට මා ස්තුතිවන්ත වෙමි. මා ඇයට එපමණට ආදරය කරන නිසා ය.

මා අත තිබූ සඟරාව ගෙන පිටු එකින් එක පෙරලුවෙමි. මාගේ ඇස ක්ෂණිකව ඇදී ගියේ ඇසක් තුළ සටහන්ව තිබූ නිරුවත් වූ කාන්තාවකගේ රූපයක් දෙසටය. මම එදෙස ටික වේලාවක් බලා සිටියෙමි. ඇයට මෙපමණ හපන්කමක් කරන්න පුළුවන් වූයේ ඈ තුල වූ දක්ෂතාවය නිසායැයි මට සිතුනි. ඇයට මෙපමණ දක්ෂකමක් කිරීමට හැකිවූයේ ඇය පරිපූර්ණ වූ උත්පත්තියක් ලැබූ නිසා ය.

මම ඇගෙන් මෙසේ ඇසුවෙමි.

''ඇයි ඔයා මා දිහා බලාගෙන ඉන්නේ''

''ඈ නිහඬ ය''

''ඔයාගේ ඇස් මෙතරම්ම ලස්සන වුනේ කොහොම ද?''

මා දෙස බලාගෙන සිටින ඈ මෙසේ කියන්නා සේ මට හැගින.

''අවට පරිසරය දකින්න, ලෝකයේ සුන්දරත්වය විඳින්න, එහි ජීවත්වන මිනිසුන්ගේ ජීවිතවලට එබිකම් කර බලන්න, මිනිස් ජීවිත ඔවුන්ගේ සිත හඬා වැටෙන අයුරු මුහුණේ ඉරියව්වෙන් දැක ගැනීමටත් එය වෙනස් කරන්නත් මට පුළුවනි.''

ඇය කියාගෙන ගියේ යැයි මට සිතිණ.

විශාල තණබිමක් තුල ඇති රුස්ස ගසක් යට තබා තිබෙන යකඩ පුටුවක වාඩි වී සිටින්නා සේ සැහැල්ලුවකින් ඇය සිටී. ඇය මෙපමණ සැහැල්ලුවකින් සිටින්නේ එතරමම චාම් නිසා දැයි මට සිතේ.

දිනක් මා ඇය සමග ලංකාවේ බොහෝ තැන්වල සංචාරය කිරීමට තීරණය කළෙමි. මා රියදුරු අසුන මතත් ඈ මට වම්පසින් ඇති අසුන මතත් වාඩි විය. තුරුලතාවලින් ගහන වූ උඩුවියනක් සේ සැදුණු ඝණ වනාන්තර ගල්පර අතරින් කඩා හැලෙන දිය ඇලි, පුරාණ විහාරස්ථාන, ගංගාවල් පසුකර බොහෝ ස්ථානවලට අප ගමන් කළෙමු.

සිංහරාජ අඩවියට ඇතුලු වූ අපි ලංකාවට ම ආවේනික වූ බිනරමල, අං කටුස්සා සහ බුලත් හපයා වැනි සතුන් දැක ගැනීමට වාසනාවන්ත වීමු. එය මාගේ ඇසට සමීපව දැක ගැනීමට හැකි වූයේ ඇගේ නොමඳ සහාය නිසා ය. හෝර්ටන් තැන්නට ලඟා වූ අප රාත්‍රිය ගත කළේ පිටවල පතන ආසන්නයේ අලංකාරවත් පරිසරයක තිබූ ඉතා කුඩා නිවසක ය. හිරු බැස යාමත් සමග තණ උලාකෑමට එන ගෝනුන්ගෙන් අවට පරිසරය තව තවත් සුන්දර විය. පලඟැටියන්ගේ ශබ්දයත්, දිය ඇලිවල ඝෝෂාවත්, ඝන මීදුමත් ඇයට ද දැනෙන්නට ඇතැයි මට සිතුණි. රාත්‍රි 11.00ට පමණ අපි නින්දට ගියෙමු.

ගස් අතු අතරින් රිංගමින් මහ පොළොව සොයා එන හිරු කිරණත් සමග අවදි වූ අපි උණුසුම් කෝපි කෝප්පයක රස වින්දෙමු. මා පැමිණියේ මින් කිසි දිනෙක නුදුටු ඒ සුන්දර පරිසරයේ පහස ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි. එම සුන්දරත්වය මා සිතැගි පරිදි ලබා ගැනීමට ඇය මට බෙහෙවින් උපකාරී විය.

ඇගේ මෙම ලස්සන ඇස්වලින් ලෝකය දකීමට මා දරණ ප්‍රයත්නය මා කිසි දිනෙක අත් නොහරිමි.



## Shanon, Sahara & Sheryl Solamans

It was a Silver shiny super sunday
So Solamans and his two sisters....
Went to spend their leisure time
at the shore slowly slowly slowly....

Shanon search some sea shells
Surround through the sands....
But Sahara saw the sceneries....
She looked around the beach
Sheryl Solaman shotted some snaps....
for his society activities....
Sea waves getting started
step by step speedy speedy speedy....

Some times up some times down
Suddenly seven huge waves surround them all
Shanon and Sahara screamed so loudly
Sweet girls saved by their savior Sheryl....

So they feel slippery slippery stones
surrounded some speedy several waves
learned how to share adventure moment
Just like a sweet dream.... But so dangerous

**H. K. J. Buddhikā Gamage**

***4573 - 3rd Year***

# වනජීවී හා ස්වභාව සෞන්දර්ය ඡායාරූපකරණය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන අංශය සංවිධානය කළ වනජීවී හා ස්වභාව සෞන්දර්ය ඡායා-ාරූපකරණ ව්‍යාපෘතියට ස්වභාවධර්මයේ අපූර්ව නිර්මාණයක් වූ හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානය හා ශ්‍රී ලංකාවේ පැරණි ම වනජීවී රක්ෂිතයන්ගෙන් එකක් වූ යාල වනෝද්‍යානය ද ඇතුලත් විය.

වනජීවී හා ස්වභාව සෞන්දර්ය ඡායාරූපකරණ ව්‍යාපෘති-යේ අපගේ පළමු සංචාරය වූයේ ''හෝර්ටන් තැන්න'' ජාතික වනෝද්‍යානයයි.

අපගේ මෙම චාරිකාවේ මූලික අරමුණ වූයේ හෝර්ටන් තැන්නේ පවතින සුන්දරත්වයේ ආත්මීය හවුල්කරුවන් වෙමින් ඡායාරූපකරණයේ නියැලීම බැවින් සුපුරුදු වන නිවහන් වලින් බැහැරව කඳවුරු බිම් කලාපයේ කූඩාරම්වල රාත්‍රී දෙකක් ගත කිරීමට සැලසුම් කර තිබිණ.

ක්‍රම ක්‍රමයෙන් මෝරා ගිය වැහි බීරුම ද නොතකා අප රැගෙන ගිය කූඩාරම්, පැය භාගයකට ආසන්න කාලයක් තුළ ස්ථාන කීපයක අටවා ගැනීමට සිසුසිසුවියන් සමත්විය. චාරිකා-වට සහභාගි වූ සිසු දූරියන්, කාන්තාවන්, කුඩා දරුවන් පවා රාත්‍රිය පුරා ඇද හැළුන ධාරානිපාත වර්ෂාව ද නොතකා වන සතුන්ගෙන් ගහන වූ මහ වනයේ මෙම කූඩාරම් තුළ රාත්‍රිය ගත කරමින් ඇඟ හිරි ගඩු පිපෙන සීතල පිළිබඳ සජීවී අත්දැකීමක් ලබාගැනීම සුවිශේෂී අවස්ථාවක් විය.

පසුදින අලුයම අපගේ ගමන් මාර්ගය වූ හෝර්ටන් තැන්න වන පිවිසුමේ සිට බේකර්ස් ඇල්ල දක්වා වූ ගමන් මාර්ගය පෙරදින රාත්‍රියේ ඇද හැලුන ධාරානිපාත වර්ෂාවත් සමඟ ඉතා දුෂ්කර ගමන්මාර්ගයක බවට පත්ව තිබිණ.

අලුයම මෙම ගමනට එක්වූ අපට චිමිණි පොකුණ, බේකර්ස් ඇල්ල හා ලෝකාන්තය ද නරඹා සුන්දර ඡායාරූප රාශියක් ද රැගෙන ප.ව.2.00ට පමණ ආපසු පැමිණීමට හැකිවුවද, ප්‍රමාද වී ගමනට එක් වූ පිරිසට ඉතා අමිහිරි හා කටුක අත්දැකීමකට මුහුණ දීමට සිදුවිය. ඒ හිටි හැටියේ ඇද හැලුන ධාරානිපාත වර්ෂාවයි.

සවස් වරුවේ ආරම්භ වූ ඒ ධාරානිපාත වර්ෂාව එදින රාත්‍රිය පුරා ම පැවතියේ මහා වනාන්තරයේ ගස් අතු අඹරවමි-න් පැමිණි මහා සුළඟක් ද සමගින් ය. වරෙක අප සිටි කූඩාරම් ගලවාගෙන යන තරමට සුළඟ බියකරු විය. රාත්‍රිය පුරා නින්ද අප අසලට පැමිණියේ හෝ අපට නින්ද කරා යාමට හෝ හැකියාවක් නොතිබිණි.

## හෝර්ටන් තැන්න

1937 දී වන සත්ත්ව හා වෘක්ෂ ලතා ආඥාපනත හඳුන්වා දීමෙන් අනතුරුව දිවයිනේ වනජීවී රක්ෂිත ප්‍රකාශයට පත්ක-රන ලද අතර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සං-රක්ෂණය කරනු ලබන මෙම රක්ෂිතයන් ජාතික රක්ෂිත හා අභය භූමි වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිවේ.

හෝර්ටන් තැන්නේ අතීතයට මඳක් එබිකම් කරනු ලැබුව-හොත් එය මහතැන්න, මහ එළිය, වී මංතලාව, ගෝන තැන්න යන නම් වලින් හඳුන්වා ඇති බව ජනප්‍රවාදයන් හි සඳහන් වේ. කලක් මෙය අලින්ගෙන් ගහන වීම නිසා ''එලිෆන්ට් ප්ලේන්'' නමින් ද, ගෝනුන්ගෙන් ගහන වීම නිසා ''එල්ක් ප්ලේන්'' නමින් ද හඳුන්වා ඇත.

නුවර එළියේ සිට කි.මී 35ක් දුරින් උතුරින් තොටුපල කන්ද හා පට්ටි පොලට ද, දකුණින් ලෝකාන්තටය ද, නැගෙනහිරින් ඔහිය ගම්මානයට ද, බටහිරින් ශ්‍රී පාද අභය භූමිය , කිරිගල් පොත්ත හා අග්‍රා දූපත් වලින් ද මායිම්ව හෙක්ටයාර් 3159.8 ක් පුරා විසිරී පවතින මනස්කාන්ත ජල ද්‍රෝණියක් වන හෝර්ටන් තැන්න ස්වභාව ධර්මයෙන් අපට ලැබුණු මහඟු දායාදයකි.

හෝර්ටන් තැන්නේ වාර්ෂික වර්ෂාපතනය මී.මී. 2150 ක් වන අතර උපරිම උෂ්ණත්වය සෙල්සියස් අංශක 27 හා අවම උෂ්ණත්වය සෙල්සියස් අංශක 5ක් පමණ ද වේ. අතිශයින් ම සංකීර්ණ ජෛව විවිධත්ව පද්ධතියකින් සමන්විත සුවිශේෂී පරිසර පද්ධතියකට හිමිකම් කියනු ලබන මෙය නිරන්තරයෙන් අහසින් ගලා හැලෙන වර්ෂාවෙන් ද, ගස් අතුපතර වැදී පිනි බිඳු ලෙසින් මිහිකත සිප ගන්නා මිහිදුමෙන් ද ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් වී ඇත.

## ශාක විශේෂ හා සත්ව විශේෂ

හෝර්ටන් තැන්නට ම ආවේණික වූ විවිධ ශාක වර්ග අතර සුදු බිනර, නිල් බිනර, බෝවිටියා, වෙනිවැල් හා මාංශ භක්ෂක ශාක වන වටවැස්ස හා කඳුලැස්ස ප්‍රධාන තැනක් ගනී. අලිකන්, කුඩු මිරිස්ස, හාතාවාරිය, වැල් මදට, වැල් වෙරළු ආදිය ද මෙහි බහුල වශයෙන් දක්නට ලැබේ.

ක්ෂිරපායී සත්ව විශේෂ 14ක් හෝර්ටන් තැන්නේ වෙසෙන අතර, බහුල වශයෙන් වර්ධනය වෙමින් පවතින ගෝනුන් ඉන් ප්‍රධාන තැනක් ගනී. හඳුන් දිවියන්, මීමින්නන්, ඕලුමුවන්, වල්



ඌරන්, රිලවුන්, දඬු ලේනුන්, කඳුකර ලේනුන් ද හෝර්ටන් තැන්නට ආවේණික සත්ත්ව විශේෂ ලෙස මෙහි දක්නට ලැබේ.

හෝර්ටන්තැන්න ආශ්‍රිතව ජීවත්වෙන උරග විශේෂ අතර ලේ මැඩිල්ලා හා ගැරඩියාද දක්නට ලැබෙන අතර, හිකනලා, කටකලු කටුස්සා, අං කටුස්සා, කුරු බෝදිලිමා, පිණුම් කටුස්සා ද හෝර්ටන් තැන්නටම ආවේණික සත්ව විශේෂ ලෙස නම් කළ හැකිවේ.

## යාල ජාතික උද්‍යානය

රුහුණු ජාතික වනෝද්‍යානය ලෙසින් 1938 දී ප්‍රකාශයට පත්වී ඇතත් ''යාල'' නමින් දෙස් විදෙස් හි ප්‍රචලිත වූ මෙම භූමි ප්‍රදේශය දීර්ඝ ඉතිහාසයකට නෑකම් කියයි. කළමනාක-රණ කලාප 05කින් හා දැඩි ආරක්ෂිත ප්‍රදේශයකින් ද අභයභූමි 03කින් ද සමන්විත මෙම උද්‍යානය විශාලත්වයෙන් හෙක්ටයාර් 97,880.7ක් පමණ වේ.

8වන පිටුවට....

# මාසික තරග ජයග්‍රහණ

**2007 ජූනි මාසික තරගය**

| **වර්ණ** | **කලු / සුදු** |
| --- | --- |
| 1. රංජිත් පෙරේරා | 1. විරාජ් ලියනාරච්චි |
| 2. ඩබ්ලිව්. බුද්ධික ප්‍රියදර්ශන | 2. සුනන්ද කෝදාගොඩ |
| 3. විරාජ් ලියනාරච්චි | 3. ඉන්දක හෙට්ටිආරච්චි |

**විහාරමහා දේවි උද්‍යාන තරගය - 2007**

| **වර්ණ** | **කලු / සුදු** |
| --- | --- |
| 1. ප්‍රියන්ත අමරසේකර | 1. විරාජ් ලියනාරච්චි |
| 2. සුනන්ද කෝදාගොඩ | 2. ඩී. නෙරංජන් |
| 3. පී. ජී. එල්. ලවිනිකා | 3. ප්‍රියන්ත අමරසේකර |

**2007 අගෝස්තු මාසික තරගය**

| **වර්ණ** | **කලු / සුදු** |
| --- | --- |
| 1. ඩබ්ලිව්. අනුරාධා සන්දීපිකා | 1. ප්‍රියන්ත මීගොඩ |
| 2. විරාජ් ලියනාරච්චි | 2. ධනුෂ්ක බණ්ඩාර |
| 3. ඉන්දක හෙට්ටිආරච්චි | 3. කේ. කේ. විතානගේ |



විහාරමහාදේවි තරගයේ සහ ශ්‍රී ලංකන් ෆොටෝ ලවර්ස් ඔන්ද ස්පොට් තරගයේ ප්‍රථම ස්ථානය දිනූ විරාජ් ලියනාරච්චිගේ (5118) ඡායාරූපය

## ෆොටෝ ලවර්ස් තරග ජයග්‍රහණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයට

ශ්‍රී ලංකා ෆෝටෝලවර්ස් ආයතනය විසින් 2007.09.02 වන දින මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී නොමිලේ පවත්වනු ලැබූ එක් දින වැඩමුළුව අතරතුර දී "On the Spot" නමින් ඡායාරූප තරගයක් සංවිධානය කරනු ලැබූ අතර එම තරගයේ පළමු හා තෙවන ස්ථාන දිනාගැනීමට ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන් දෙපළක් සමත්විය. මෙහි පළමු ස්ථානය දිනාගනු ලැබුවේ සංගමයේ පළමු වසර ශිෂ්‍යයකු වන විරාජ් ලියනාරච්චි වන අතර තෙවන ස්ථානය ඩිප්ලෝමා වසරේ කිත්සිරි ගුණවර්ධන විසින් දිනා ගන්නා ලදී. මෙම වැඩමුළුවේ මාධ්‍ය අනුග්‍රහය ''ලංකා කැමරා'' සඟරාව විසින් දරණ ලද අතර සියළු ම ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ලෙස වසර කීපයක ලංකා කැමරා කලාප ප්‍රදානය කරන ලදී.

මෙම තරගය විනිශ්චය කරනු ලැබුවේ ප්‍රවීණ ඡායාරූප ශිල්පී හෙන්රි රාජකරුණා මහතා, හර්ෂ මධුරංග ජයසේකර මහතා සහ මලීෂා බැක්ග්‍රවුන්ඩ්ස් හි අධිපති, චිත්‍ර ශිල්පී සුදේශ් පෙරේරා මහතා විසිනි.

7වන පිටුවෙන්....

රංචු වශයෙන් හා තනිතනිව ගැවසෙන වල්අලින්ට අමතරව වල් මී හරකුන්, තිත්මුවන් හා ශ්‍රී ලංකාවට ආවේනික පක්ෂීන් වර්ග රාශියක් ද මෙහි බහුලව දැකිය හැකිවේ. වලි කුකුලා, හබන් කුකුලා, අලි මානාවා, බහුරුමානාවා, වැකියා හා මහ සුදුකොකා ඉන් ප්‍රධාන තැනක් ගනී. මෙහි වෙසෙන දිවියන් වලසුන් හා කිඹුලන් ද ඡායාරූප ශිල්පීන්ගේ හා සංචාරකයින්ගේ දැඩි අවධානයට ලක්ව ඇත.

වියලි කලාපයේ ජල හිඟය යාල ජාතික උද්‍යානයට ප්‍රධාන ගැටලුවක් වුව ද, අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වූ වන සතුන් ජලය සොයා උද්‍යානයෙන් පිටතට ඇදෙන මෙම කාලය ඡායාරූප ශිල්පීන්ට යාල සංචාරය සඳහා ඉතා වැදගත් වකවානුවකි. වන සතුන්ගේ විවිධ චර්යාවන් විවිධ කැමරා කෝණයන්ගෙන් රූපගත කරගන්නට පැය ගණන් වරු ගණන්, දින ගණන් යාල ජාතික උද්‍යානයේ කාලය ගත කරන ඡායාරූප ශිල්පීන්ට සිය උවමනාවන් සිතැගි පරිදි ඉටුකර ගැනීමට ''යාල'' තරම් සමීප වෙනත් වන උද්‍යානයක් නොමැති තරම් ය.

වනජීවි හා ස්වභාව සෞන්දර්ය ඡායාරූපකරණ චාරිකාවේ දෙවන අදියර වූ යාල ජාතික උද්‍යාන චාරිකාව ද අතිශයින් ම සුන්දර හා බිහිසුණු අත්දැකීම් රාශියකින් සමන්විත විය. වරෙක අප ගිය වාහන හයෙන් හතරක් ම වටකර ගැනීමට අලි රංචුවක් සමත්විය.

මෙම චාරිකා දෙකෙහි දී ගනුලැබූ දුර්ලභ වනජීවී චර්යාවන් හා ස්වභාව සෞන්දර්ය ඡායාරූප රසක් ඇතුලත් ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ වනජීවි හා ස්වභාව සෞන්දර්ය ඡායාරූප ප්‍රදර්ශනය සැප්තැම්බර් මස 8 සිට 11වන දින තෙක් කොළඹ ජාතික කලා භවනේ දී පැවැත්වීමට එම සංගමය කටයුතු සංවිධානය කර ඇත.

සටහන සහ ඡායාරූප - **සුනන්ද කෝදාගොඩ**
***(ඩිප්ලෝමා වසර)***

